කරෙයිතිවු ප්‍රාදේශිය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 10 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 16 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ කරෙයිතිවු ප්‍රාදේශිය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට කරෙයිතිවු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .

1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

1.3.2 . ගණකාධිකරණ අඩුපාඩු .

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය .

( අ ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව ගිණුම් වල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ආ) ටෙන්ඩර් තැන්පතු රු . 172,907 ක් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට දීර්ඝ කාලයක් පුරා අඛණ්ඩව තැන්පතු ලේඛනයෙහි දක්වා තිබුණි .

(ඇ) සේවක ණය ලේඛණය අනුව නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු . 5,676 ක් වැඩිපුර අයකර තිබුණි .

(ඇ) 2009 සහ 2010 වර්ෂ සඳහා අයකර ගත යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

1.3.3. අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම් . |
|---|---|---|
| ( අ ) ප්‍රාදේශීය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 . | | |
| රීති අංක 180 | - | මුදල් හා ගබඩා පරිහරණය කරන නිලධාරීන් විසින් ආරක්ෂිත ඇප තැන්පත් කර නොතිබුණි . |
| රීති අංක 217 | - | පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි . |
| රීති අංක 218 | - | සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි . |

රීති අංක 219 - ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වෙනම ලේඛනයක් විස්තරාත්මක ලැයිස්තුවක් සහ සමීක්ෂණ වාර්තා පිළියෙල කර නොතිබුණි.

( ආ ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

මුදල් රෙගුලාසි 104(1) - වටිනාකම රු. 103,505 ක් වූ නැති වූ පොත් 1737 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු . 1,834,734 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු . 450,731 ක් විය .

2 . 2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ .

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i | වරිපනම් සහ බදු | - | - | - |
| ii | කල්බදු | 1,965 | 1,240 | - |
| iii | බලපත්‍ර ගාස්තු | 186 | 165 | - |
| iv . | වෙනත් ආදායම් | 80 | 146 | - |

2.2.2 උසාවි දඩ

කල්මුනේ සහ අක්කරපත්තු මහේස්ත්‍රාත් උසාවි මගින් රැස් කරන ලද රු. 470,900 ක් වූ උසාවි දඩ අයකර ගෙන පළාත් ආදායම් කොමසාරිස්/ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කිරිමට කටයුතු කර නොතිබුණි .

2.2.3 මුද්දර ගාස්තු

2008, 2009, 2010 වර්ෂ වෙනුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි .

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම, තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 000 | රු. 000 | රු. 000 |

| | | | |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 7,493 | 7,982 | (489) |
| වෙනත් | 2,255 | 2,512 | (257) |
| උප එකතුව | 9,748 | 10,494 | (746) |
| ප්‍රාග්ධන වියදම් | 5,165 | 3,639 | 1,526 |
| මුළු එකතුව | 14,913 | 14,133 | 780 |

2.4 . මානව සම්පත් කළමනාකරණය .

අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | - | 01 |
| ද්විතියික ශ්‍රේණිය | 05 | 14 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 07 | 07 |
| වෙනත් | - | 12 |
| | 12 | 34 |

2.5 . වත්කම් කළමනාකරණය .

2.5.1 ලැබිය යුතු ගිණුම් .

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් වල වටිනාකම රු . 28,838,860 ක් වූ අතර වර්ෂය ඉක්ම වූ ශේෂයන්ගේ වටිනාකම රු . 25,439,332 ක් විය.

2.5.2 ලැබිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය රු . 655,927 ක් විය . වර්ෂය ඉක්ම වූ ශේෂයන්ගේ වටිනාකම රු . 34,492 ක් විය .

2.6 . මෙහෙයුම් අකාර්යක්ෂමතා .

සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් දෙන ලද අත්තිකාරම් වලින් රු . 405,000 ක් පියවා නොතිබුණි .

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .